**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
**සෙත්සිරිපාය, බත්තරමුල්ල**

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 645 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 15/04/2024<br>පැය 0800 |

# මාධ්‍ය නිවේදනය

## 01. වෙඩි තබා තුවාල සිදුකිරීමක් - මින්නේරිය පොලිස් වසම.

2024.04.14 වන දින රාත්‍රී කාලයේදී මින්නේරිය පොලිස් වසමේ යාය 04, ගිරිතලේ ප්‍රදේශයේදී ගෙලට වෙඩි වැදීමෙන් තුවාල ලැබූ ගැහැණු ළමයෙකු පොළොන්නරුව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබන බවට මින්නේරිය පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මෙලෙස තුවාල ලබා ඇත්තේ වයස අවුරුදු 17 ක් වන යාය 14, ගිරිතලේ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

තුවාලකාරිය පවුලේ අයවලුන් සමඟ ඥාති නිවසකට ගොස් සිටියදී මෙම වෙඩි තැබීම සිදුකර ඇති බවට දැනට සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත. වෙඩි තැබීම කවුරුන් විසින් සිදුකර ඇත්ද යන්න මෙතෙක් අනාවරණය වී නොමැති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා මින්නේරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. මනුෂ්‍ය ඝාතනයක් - ගලේවෙල පොලිස් වසම.

2024.04.15 වන අද දින අළුයම් කාලයේ ගලේවෙල පොලිස් වසමේ අලුත්වැව වෙල්පාර හංදිය අසලදී දෙපාර්ශවයක් අතර සිදු වූ බහින් බස් වීමක් නිරාකරණය කිරීමට මැදිහත්වූ පුද්ගලයෙකු හට තියුණු ආයුධයකින් පහරදී බරපතල තුවාල ලබා ගලේවෙල රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇති බවට ගලේවෙල පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වූ බඹරගස්වැව, ගලේවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගලේවෙල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, ඝාතනය සිදුකල සැකකරුවන් හඳුනාගෙන ඇති අතර, අත්අඩංගුවට ගැනීම සඳහා ගලේවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**